# ඡායා රූ පිළිසඳර

2010 මැයි /ජූනි

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**




ඡායාරූපය : බන්දු ගුණරත්න

## ජාත්‍යන්තර ජයග්‍රහණවලට සංගමයේ උපහාරය

සෑම වසරක ම විදේශීය ඇගයීම්වලට බඳුන්වෙමින් ඡායාරූප තරගවලින් ජයග්‍රහණ ලබා, මව්බිමට ද සංගමයට ද කීර්තියක් අත්කර දෙන සාමාජික භවතුන්ට තිළිණ ප්‍රදානයක් සිදුකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කොට ඇත. මේ අනුව ඒ ඒ වසරවල ජාත්‍යන්තර ජයග්‍රහණ දිනාගන්නා අපේ ඇත්තන්ට වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනයේ දී විශේෂ උපහාරයක් පිරිනැමේ. මෙම තීරණය 2009/2010 නිල වර්ෂයේ පටන් ක්‍රියාත්මක වේ.

## කැමරා උපකරණවල ආනයන බදු ලිහිල් කෙරේ

ඡායාරූප ශිල්පීන්ට අත්‍යවශ්‍ය කැමරා සහ අනෙකුත් උපකරණ සඳහා පනවා තිබූ ආනයන බදු ලිහිල් කිරීමට රජය පියවර ගෙන ඇත.

මීට පෙර අවස්ථා කිහිපයක දී ම මෙය ක්‍රියාවට නංවන ලෙස අප සංගමය ද ඇතුළුව ඡායාරූප සංගම් කීපයක් ජනාධිපතිතුමාගෙන් සහ රජයෙන් ඉල්ලීම් කර තිබූ අතර, එය මෙලෙස ක්‍රියාවට නැංවීම ඡායාරූප ශිල්පීන් සෑම දෙනාගේ අපේක්ෂා ඉටු වීමක් ලෙස අපි සළකමු.

## Eminence of Photographic Art
## වෘත්තීය කණ්ඩායමේ වැඩමුළුව ජූනි 12

අපේ වෘත්තීය කණ්ඩායම මෙවර වැඩමුළුව සඳහා කලාත්මක ඡායාරූපකරණයේ විශේෂතා, නිර්මාණකරණය සහ නිර්මාණ සම්ප්‍රදා පිළිබඳ අවධානය යොමු කොට ඇත. චිත්‍ර කලාවෙන් ඡායාරූප ශිල්පයේ නිර්මාණශීලී වටිනාකම් දියුණු කළ හැකි විධික්‍රම, කලාත්මක ඡායාරූපකරණයේ නව ප්‍රවණතා සහ ජාත්‍යන්තර ජයග්‍රහණ පතා ඡායාරූප නිර්මාණය පිළිබඳව ද මෙහි දී කරුණු පැහැදිලි කෙරේ. නූතන ලෝකයේ ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ට කෘති ලෙස ගෞරවයට ලක් වූ ඡායාරූප සිය ගණනක් මෙදින දැක බලාගත හැකි වනු ඇත. වැඩමුළුවේ සම්පත් දායකත්වය සම්මානලාභී ඡායාරූප කලාවේදීන් වන හෙන්රි රාජකරුණා, ජී. හෙට්ටිආරච්චි සහ සම්මානලාභී චිත්‍ර කලාවේදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර යන විද්වතුන් විසිනි.

මෙම වැඩමුළුව 2010 ජූනි මස 12 දින පෙ.ව. 8.30 සිට ප.ව. 1.00 දක්වා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේ දී පැවැත්වේ.

## ලංකා කැමරා නිකුත් වේ.

ලංකා කැමරා සඟරාවේ නවතම කලාපය දැන් නිකුත් වී ඇත. සාරගර්භ ලිපි සහ ඡායාරූප සමුදායකින් ද නව නිමාවකින් ද මෙවර සඟරාව හැඩගැන්වී ඇත.



**සැරසෙන් ...!**
**එල්ලවෙන්....!!**
**යා..........!!! ................ කොයිබට දෝ?**

# FIAP ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයට
## 15th International Exhibition of Photography 2010

Patronage No. 2010/111

සංගමයේ 60 වන සංවත්සරය අළලා ඉදිරි නොවැම්බර් මාසයේ පැවැත්වෙන 15 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයේ අයදුම්පත් දැන් ලබාගත හැකි ය. සෑම තරග අංශයකට ම විශිෂ්ටතා 30 බැගින් පිරිනැමෙන මෙම ප්‍රදර්ශනය ලෝකයේ විශිෂ්ටතම ඡායාරූප කලා කෘති එකතුවක් ලෙස ඔබ හමුවේ ප්‍රදර්ශනය කෙරෙනු ඇත. තරු හතර සමරු කලාපයක් ද නිර්මාණ ඉදිරිපත් කරන සැමට නොමිලේ ලැබෙන අතර, මෙහි දී ඔබ ලබාගන්නා විශිෂ්ටතාව ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයෙන් සම්මාන දිනාගැනීමට ද අදාළ මූලික සුදුසුකමක් වනු ඇත.

ඔබේ නිර්මාණශීලිත්වය උරගා බැලෙන ඉහළ ම කඩඉම FIAP ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයට ඔබේ නිර්මාණ ද අභිමානයෙන් ඉදිරිපත් කරන්න. ඔබේ මෙන් ම ඔබේ හිත මිතුරන් ද ප්‍රදර්ශනය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට දිරි ගන්වන්න. අයදුම්පත් සංගමයෙන්, දිවයින පුරා අනිකුත් ඡායාරූප ශිල්ප සංගම් වෙතින්, කොළඹ යුනියන් පෙදෙසේ ඩිජිටල් එක්ස්පෝෂර් වර්ණ රසායනාගාරයෙන්, කුරුණෑගල සිරිසර වර්ණ රසායනාගාරයෙන් සහ තැපැල් මගින් ලබාගත හැකියි. වෙනත් විමසුම් සඳහා 0712726517 අංකයෙන් සුනිල් වික්‍රම මහතා අමතන්න.

# National Photographic Festival
## 60 වන සංවත්සර ජාතික ඡායාරූප ශිල්ප උළෙල

අප සංගමයේ 60 වන සංවත්සරය නිමිත්තෙන් පැවැත්වෙන ජාතික ඡායාරූප ශිල්ප උළෙල නොවැ 05, 06, 07 දිනවල කොළඹ 10 ඩී.ආර්. වීරවර්ධන මාවතේ ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වෙනු ඇත.

FIAP ඡායාරූප ප්‍රදර්ශනය, ඡායාරූප ශිල්ප අධ්‍යාපනික ප්‍රදර්ශනය, මංගල ඡායාරූපකරණය, ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ විශේෂ ඉදිරිපත් කිරීම්, ඡායාරූප ශිල්පයේ සෑම අංශයක් ම නියෝජනය වන ප්‍රදර්ශන කුටි, සිනමා රූපවාහිනී මාධ්‍ය කුටි, විලාසිතා සහ මංගල ඡායාරූපකරණ සැසිවාර, ඡායාරූප ශිල්ප වැඩමුළු, ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ තිරගත කිරීම්, ඡායාරූප ශිල්ප පොත් දොරට වැඩීම් ඇතුළු විවිධාංග ගණනාවක් මෙයට අඩංගු කිරීමට සැලසුම් සකස් කෙරෙමින් තිබේ.

ප්‍රදර්ශන කුටි සියයකට අධික සංඛ්‍යාවකින් ද යුතු මෙම උළෙල අභිමානවත් ලෙස පැවැත්වීමට ඔබගේ දායකත්වය සහ කැපවීම අත්‍යවශ්‍ය වේ. ඔබ අවංක වූ අධ්‍යාශයෙන් සංගමය වෙනුවෙන් කරන කැපකිරීම සඳහා මේ හොඳ ම අවස්ථාවයි. ඔබේ දායකත්වය සංගමයට අවශ්‍ය ම වන මොහොත මෙම උළෙලයි. ඒ නිසා මේ ගැන ඔබේ දායකත්වයෙහි පළමු පියවර, ජූනි 20 දින එළැඹෙන මහා සභාවේ දී මෙහි සැලසුම් කාර්යය සඳහා ඔබගේ වටිනා අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමයි.

## 60වන සංවත්සර සැමරුම් මුද්දරය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 60 වන සංවත්සරය අළලා සැමරුම් මුද්දරයක් නිකුත් කිරීමට විධිවිධාන යොදා ඇත. මුද්‍රණය කරනු ලබන්නේ ඇණවුම් කරන මුද්දර සංඛ්‍යාව පමණක් බැවින් ඔබට මෙම සැමරුම් මුද්දරය අවශ්‍ය නම් 0714402950 අංකයෙන් අශෝක බුද්ධදාස මහතා අමතා ඔබේ ඇණවුම තහවුරු කරන්න. රු 5/= ක මුද්‍රිත මිල වටිනාකමක් සහිත මෙම මුද්දරය, තැපැල් දෙපාර්තමේන්තුව වෙතින් අපට ලබාගත හැකි වන්නේ රු 100/= ක මුදලකට බැව් කරුණාවෙන් සලකන්න. මුද්දරය 60 වන සංවත්සර උළෙල සමාරම්භක අවස්ථාවේ නිල වශයෙන් නිකුත් කෙරේ.

## සමරු මුද්දරය සහ සමරු ටී ෂර්ටය ලබාගැනීම

60 වන සංවත්සරය අළලා නිකුත් කෙරෙන සමරු මුද්දරය (එක් මුද්දරයක් රු. 100/=) සඳහා මුදල ද රැස්වීමේ දී එම ව්‍යාපෘතිය භාරව කටයුතු කරන අශෝක බුද්ධදාස (071 4402950) මහතාට ලබාදීමෙන් ඔබේ සැමරුම් මුද්දරය වෙන්කරවා ගත හැකි ය. එමෙන් ම එම සංවත්සරය අළලා නිකුත් කෙරෙන සමරු ටී ෂර්ටය ද රු. 500/= ක් අශෝක බුද්ධදාස මහතාට ලබාදීමෙන් එදින ම ඇණවුම් කළ හැකි ය.

### 60 වන සංවත්සර යාවජීව සාමාජිකත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය

අප සංගමයේ 60 වන සංවත්සරය නිමිති කොට ගෙන දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති පැරණි සාමාජිකයින් සඳහා යාවජීව සාමාජිකත්වය පිරිනැමීමේ විශේෂ කාල සීමාවක් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කෙට ඇත. ඒ අනුව දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති එහෙත් යළි සංගමයට සම්බන්ධවීමට කැමැත්තෙන් පසුවන සහ වසර පහකට වැඩි කාලයක් සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයින් වශයෙන් කටයුතු කළ අයට මේ සඳහා ඉදිරිපත් විය හැකි ය. ජූනි 01 දින සිට නොවැ 30 අතර කාලය තුළ පමණක් මෙම වරප්‍රසාදය ලැබිය හැකි වේ.

සංගමයට දැඩි ලෙස ඇලුම් කරන එහෙත් දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති ඔබ දන්නා අයට මේ පිළිබඳ දැනුම් දෙන මෙන් ඉල්ලා සිටිමු. එලෙස යාවජීව සාමාජිකත්වය ලබා ගැනීමේ අභිලාෂයෙන් පසුවන අය, අවශ්‍ය වැඩිදුර උපදෙස් සඳහා 077688879 අංකයෙන් එන්.ආර්. අභයසිංහ මහතා සමග සම්බන්ධ වන්න.

### කෑගල්ල ඡායාරූප කලා දැක්ම ජූනි 18 දා

කෑගල්ල ඡායාරූප කලා සංගමය මගින් සංවිධානය කොට ඇති සමස්ත ලංකා ඡායාරූප ප්‍රදර්ශනය ජූනි 18 වැනි දින පෙ.ව. 8.30 ට කෑගල්ල නගර ශාලාවේ දී විවෘත කිරීමට විධිවිධාන යොදා ඇත. මෙය අප සංගමයේ ජාතික ප්‍රදර්ශන ප්‍රමිතියට යටත් ව පැවැත්වෙන දෙවන ඡායාරූප ප්‍රදර්ශනය ද වේ.

# Felicitation NPAS
# 60 වන සංවත්සර සැමරුම් කලඹ

අප සංගමයේ දසක හයක ජාතික මෙහෙවර අළලා නිකුත් කෙරෙන විශේෂ සැමරුම් කලඹ සඳහා ඔබගේ දායකත්වය ද එක් කිරීමට සෙනෙහසින් ආරාධනා කර සිටිමු.

මෙම සංවත්සර සැමරුම් කලඹ සංගමයේ එදා මෙදා තුර සියලු තොරතුරු ඇතුළත් කොට සම්පාදනය කරනු ලබන්නකි. සමාරම්භක සාමාජිකයින්, සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයින්, යාවජීව සාමාජික පිරිස, ගෞරව සහාගී සාමාජික භවතුන්, නිළධාරීන් ලෙස වගකීම් ඉසිලූ අය, ශාස්ත්‍රීය වශයෙන් ලබා ඇති ජයග්‍රහණ, සංගමයේ ඉතිහාසය, සමාජසේවා, අධ්‍යාපන, ප්‍රදර්ශන, සුබසාධන කටයුතු පිළිබඳ ඉතිහාසය පිළිබඳ ලිපි මෙහි ඇතුළත් ය. එසේ ම ප්‍රකාශන අංශයේ යටගියාව, වෘත්තීය කණ්ඩායම, ප්‍රභාලේඛිකා සංසදය, පාසල් වැඩසටහන් පිළිබඳ තොරතුරු ද වෙන් වෙන් වශයෙන් මෙයට අඩංගු වේ.

එසේ ම එදා මෙදා තුර අප සාමාජික භවතුන් අතින් නිර්මාණය වූ විශිෂ්ටතම ඡායාරූප 60ක් ද තෝරාගෙන ඇල්බමයක් වශයෙන් මෙම ග්‍රන්ථයට ඇතුළත් කෙරේ. ඉදින්, ඔබ වෙත මෙම සුවිශේෂ ප්‍රකාශනය සම්බන්ධයෙන් හෘදයංගම ආරාධනයන් තුනක් මෙහි දී ඉදිරිපත් කරමු.

**පළමුවැන්න :**

ඔබගේ ඡායාරූප අතුරින් විශිෂ්ටතම කලු සුදු ඡායාරූපයක් මෙම ඇල්බමයට ඇතුළත් කිරීමේ වරප්‍රසාදය ඔබට හිමි ය. ඒ සඳහා ඔබේ නිර්මාණය ජූනි 01 වන දිනට පෙර ඉදිරිපත් කළ හැකි ය.

(මුද්‍රිත ඡායාරූපයක් නම් 8"X10" ප්‍රමාණයෙන් ද ඩිජිටල් ඡායාරූපයක් නම් 300 dpi - Jpeg ආකාරයේ ද විය යුතු ය. ඡායාරූපයේ ප්‍රකාශනාත්මක අගය මෙන් ම මුද්‍රණ තත්වය පිළිබඳ විශේෂයෙන් සලකා බලා ඇල්බමය සඳහා තෝරා ගනු ලැබේ.)

**දෙවැන්න :**

වසර 25 කට වඩා පැරණි සංගමයේ තොරතුරු සහ අදාළ ඡායාරූප ඔබ වෙත ඇත්නම් ඒ පිළිබඳ දැනුම්දීමට කාරුණික වන්න. (විශේෂයෙන් විල්සන් හැගොඩ මහතා, ශාන්ත වීරසිංහ මහතා, වොල්වින් සිරිවර්ධන මහතා, වී.හි. හපුආරච්චි මහතා, ඒ.ඒ.එස්. අමරසිංහ මහතා, ජේ.ඒ.සී. ජයසූරිය මහතා, ල. දයානන්ද මහතා, හිල්ටන් සමරසිංහ මහතා, ජී.එල්.ආර්. ද සිල්වා මහතා යන අයගේ ඡායාරූප අවශ්‍ය වී ඇත.)

**තුන්වැන්න :**

මෙම විශේෂ සමරු කලඹ වර්තමාන වෙළඳපොළ මිල ගණන් අනුව රු 3500/= ක් පමණ වුව ද ඊට මිල නියම කොට ඇත්තේ රු. 1800/= කි එයිනිදු කල්වේලා ඇතිව ඇණවුම් කරන අයට රු 1000/= කට මෙය ලබාගත හැකි ය. ඒ නිසා ඔබේ ඇණවුම හැකිතාක් ඉක්මනින් රු 1000/= මුදල ද සහිත ව මේ සමග වන කූපනය පුරවා ඉදිරිපත් කරන්න.

**Felicitation NPAS ඇණවුම**

නම : ..............................

සාමාජික අංකය : ..............................

දුරකථන අංකය : ..............................

අවශ්‍ය පිටපත් ගණන : ..............................

ගෙවනු ලබන මුදල : ..............................

.............................. ..............................

දිනය අත්සන

මෙම විශේෂ කලාපය මුද්‍රණය කෙරෙනුයේ පිටපත් ඉතා සීමිත සංඛ්‍යාවක් පමණි. එබැවින් ඔබේ පිටපත නොවරදවා ලබා ගැනීම පිණිසත්, මුද්‍රණය සඳහා අත්‍යවශ්‍ය බරපැණ යම් තරමකින් හෝ සපුරාගැනීම පිණිසත් කඩිනමින් ඔබේ ඇණවුම ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඔබගේ වැඩිමනත් අවබෝධය පිණිස මෙම ග්‍රන්ථය පිළිබඳ තාක්‍ෂණික දත්ත පහත දක්වමු.

**Felicitation NPAS සංවත්සර සැමරුම් කලඹ**

| | |
|---|---|
| Pages | : 160 + |
| Inner Pages | : 80 gsm matt paper |
| Cover | : 400 gsm board with 230 gsm laminated jacket. |
| Size | : 210 x 260 mm |
| Selling Price | : Rs. 1800/- |

මේ සම්බන්ධ සියලු විමසීම් සඳහා 071 8106680 අංකයෙන් උදිත අමතන්න.

## 60 වන සංවත්සර සැමරුම් කලඹ ඇණවුම් කිරීමේ පහසු මග

අපේ ඇත්තන්ගේ තුදුරු හමුව, එනම් වාර්ෂික මහා සභා රැස්වීම ජූනි මස 20 වැනි දින පෙරවරුවේ කොළඹ නවනගර ශාලාවේ දී පැවැත්වෙන බව දැනට මත් ඔබ දන්නා කරුණකි. සංවත්සර සැමරුම් කලඹ සඳහා ඔබේ දායකත්වය එක්කරන්නට හොඳ ම අවස්ථාව, එදින පැමිණෙන විට අදාළ කූපනය සහ රු. 1000/= මුදල අමරා වීරසේකර (071 4115584) මහත්මිය වෙත භාරදීමයි.

---

## සංවත්සර ශාස්ත්‍රීය සංග්‍රහය

අප සංගමයේ 60 වන සංවත්සර සැමරුම අළලා පර්යේෂණ ලිපි ඇතුළත් ශාස්ත්‍රීය සංග්‍රහයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ඇතුළත් කිරීමට අදහස් කරනුයේ ඡායාරූප ශිල්පය, සිනමාව, රූපවාහිනිය, විද්‍යුත් රූප මාධ්‍ය සහ දෘශ්‍ය සන්නිවේදනය යන විෂය ක්‍ෂෙත්‍රයනට අදාළ ලිපි සමුච්චයකි. සියලු ම ලිපි නව දැනුම සහිත නිරවද්‍ය කරුණු පදනම් කරගත් ශාස්ත්‍රීය ආකෘතියකට අනුව මූලාශ්‍ර ලේඛනයක් ද සහිත ව සම්පාදනය කළ යුතු ය. ලිපි සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ හැකි ය.

අප විෂය ක්‍ෂෙත්‍රය හා සම්බන්ධ පර්යේෂණාත්මක ලිපිවලින් සමන්විත ශාස්ත්‍රීය සංග්‍රහයක් මෙතෙක් අප රටේ නිකුත් වී නොමැති හෙයින් මෙය පුරෝගාමී ජාතික කාර්යභාරයක් වනු ඇත. මෙම අභිමානයේ කොටස්කරුවෙකු වීමේ හිමිකම ඔබට ද ගෞරව සම්ප්‍රයුක්තව පිළිගන්වනු කැමැත්තෙමු. ඒ අනුව මෙම ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා ලිපියක් සකස් කිරීමට ඔබ අදහස් කරන්නේ නම් 2010 මැයි 31 දිනට ප්‍රථම අදළ මාතෘකාව ද සමගින් 0718229204 අංකයෙන් විජය බස්නායක මහතා අමතන්න.

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය**
**The National Photographic Art Society of Sri Lanka**

# මුදල් පරිපාලන නිර්ණායක

**අරමුණු**

සංගමයේ මුදල් කටයුතු ව්‍යවස්ථානුකූල වූත්, සංගමයේ අභිවෘද්ධියට හේතුකාරක වන්නා වූත් ක්‍රමවේදයකට අනුව මෙහෙයවීම මෙම චක්‍රලේඛයෙන් අරමුණු කෙරේ.

**නිර්දේශ**

**1. මුදල් අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය**

1.1. රජයේ ලියාපදිංචි පුණ්‍යායතන සඳහා රජය මගින් නිර්දේශිත කොන්දේසිවලට අනුකූල වන පරිදි සාමාජික මුදල් හා පරිත්‍යාග එක්රැස් කිරීම සහ එකී කොන්දේසි ප්‍රකාර පරිහරණය පිළිබඳ ප්‍රධාන වගකීම මුදල් අධ්‍යක්ෂවරයා සතු ය.

1.2. සංගමයේ ගිණුම්වල මුදල් සහ අත්පිට මුදල් (Petty Cash) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි කාර්යක්ෂම ලෙස මෙහෙයවීම මුදල් අධ්‍යක්ෂවරයාගේ වගකීම වෙයි.

1.3. සෑම නිල වර්ෂයක් ආරම්භයේ දී ම සංගමයේ ආර්ථික වටිනාකම් ඉහළ නැංවීම සඳහා වන දළ සැලැස්මක් මුදල් අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතු ය.

1.4. සංගමයේ වත්කම් වැඩිදියුණු කිරීම පිණිස එක් මූල්‍ය ප්‍රවර්ධන වැඩසටහක් හෝ නිල වර්ෂයක් තුළ ක්‍රියාවට නැංවීමට මුදල් අධ්‍යක්ෂවරයා පියවර ගත යුතු ය.

1.5. විවිධ ව්‍යාපෘති සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව පරිදි ඒ ඒ අධ්‍යක්ෂවරුන් වෙත අත්තිකාරම් මුදල් ලබාදීමේ බලය මුදල් අධ්‍යක්ෂවරයා සතු ය.

1.6. එකී සෑම ගිණුමක් ම විධිමත් ලෙස පියවීම මුදල් අධ්‍යක්ෂවරයාගේ වගකීමක් වන අතර, සෑම ව්‍යාපෘතියක් ම මූල්‍ය වශයෙන් සංගමයට අවාසිදායක නොවන සේ මෙහෙයවීමට උපදෙස් දීම මුදල් අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරයයි.

1.7. සෑම මුදල් වර්ෂයකට ම අදාළ ගිණුම් නිසි පරිදි ලේඛනගත කොට, වරලත් ගණකාධිකාරීවරුන් ලවා විගණනයට පාත්‍ර කොට, ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම මුදල් අධ්‍යක්ෂවරයාගේ වගකීමකි.

1.8. වාර්ෂික සාමාජික මුදල් අයකර ගැනීම, දෙවසරකට වැඩි කාලයක් මුදල් නොගෙවූ අය සෑම ලිත් වර්ෂයක් අවසානයේ ම සාමාජික නාමලේඛනයෙන් ඉවත් කිරීම සහ ඊට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමේ වගකීම මුදල් අධ්‍යක්ෂවරයාට පැවරේ. මේ සම්බන්ධව අදාළ සාමාජිකයාට ලිඛිත ව දැනුම් දිය යුතු ය.

**2. සෙසු අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය**

2.1. තම අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මුදල් වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගත යුතු අතර, අවශ්‍ය නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි අත්තිකාරම් මුදලක්, මුදල් අධ්‍යක්ෂ වෙතින් ඉල්ලා සිටිය හැකි ය.

2.2. තමන් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධ මුදල් පිළිබඳ වගකීම අදාළ අධ්‍යක්ෂවරයා විසින් දරනු ලබන අතර, එම වාර්තාවල මුල් පිටපත් මුදල් අධ්‍යක්ෂවරයාට භාර දී එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය.

2.3. සංගමයේ නමින් ක්‍රියාත්මක කරන මුදල් උපයන ව්‍යාපෘති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තොරව ක්‍රියාවට නැගීම නොකළ යුතු වේ.

2.4. මුදල් හා සම්බන්ධ වන සෑම ව්‍යාපෘතියක් ම ව්‍යාපෘති සැලසුමේ දින වකවානු පරිදි අවසන් කිරීමට සහ ගිණුම් පියවීමට විශේෂ උනන්දුවකින් කටයුතු කළ යුතු ය.

**3. සාමාජිකයින්ගේ කාර්ය භාරය**

3.1. සංගමය මගින් එහි වත්කම් ප්‍රවර්ධනය සහ විශේෂ කාර්ය සාධනය උදෙසා ක්‍රියාත්මක කරන මූල්‍ය සංවර්ධන කටයුතු සඳහා සිය උපරිම දායකත්වය ලබාදීම සාමාජික වගකීම වේ.

3.2. සංගමය වෙනුවෙන් පෙනී සිටිමින් බාහිර පාර්ශවයන් හා කරන ගනුදෙනු නියමිත උපදෙස්වලට යටත් ව සහ අදාළ අධ්‍යක්ෂවරයාගේ අනුදැනුම පරිදි සිදුකිරීමට වග බලාගත යුතු ය.

**4. විගණකවරුන්ගේ කාර්ය භාරය**

4.1. වාර්ෂික මුදල් පරිහරණයට අදාළ ව මුදල් අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරනු ලබන දත්ත පදනම් කොටගෙන සකස් කෙරෙන වාර්ෂික මුදල් වාර්තාව විගණනය කොට ඉදිරිපත් කිරීම විගණකවරුන්ගේ කාර්යභාරයයි.

4.2. එය සකස් කොට අදාළ මහා සභා රැස්වීමට පෙරාතුව මුදල් අධ්‍යක්ෂවරයා වෙත භාර දිය යුතු වේ.

# දැක්ම සහ මෙහෙවර
# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

**දැක්ම**

ලාංකීය ජනතාවගේ ප්‍රතිබිම්බ කලා සාක්ෂරතාව, නිර්මාණශීලීත්වයෙන්, ස්වාභිමානයෙන් සහ මානවවාදී ගුණයෙන් යුතුව ඉහළට ඔසවා තබන ප්‍රමුඛතම ජාතික ආයතනය බවට පත්වීම අපගේ දැක්මයි.

**Our Vision**

Our vision is to make the National Photographic Art Society of Sri Lanka, the leading national institute that elevates literacy of aesthetic visual image enhanced with creativity, self pride and humaneness in the people of Sri Lanka.

**අපේ මෙහෙවර**

ලක් දැයේ දූ පුතුනට පිළිබිඹු කලා ඥානය නොමසුරුව බෙදා හදා දීම ද, මානව භක්තියෙන් හා චරිතානුගත පෞරුෂයෙන් යුතුව ස්වකීය වෘත්තීය ස්ථාවරය ගොඩනංවා ගැනීමට සහ නිර්මාණශීලී දෘශ්‍ය මාධ්‍ය සත්කාරයක නියැලෙමින් දේශීය සංස්කෘතිය ලෝකයා හමුවේ ගෞරවාන්විත මට්ටමකට රැගෙන එනු පිණිස පූර්වගාමී දායකත්වය සැපයීම ද, ජාතික මෙන් ම අන්තර්ජාතික කලා සහ සංස්කෘතික සංවිධාන සමග සහෝදරත්වයෙන් අත්වැල් ගනිමින්, ප්‍රතිබිම්බ කලාවේදීන්, ප්‍රතිබිම්බ කලා ලෝලීන් සහ ඡායාරූප ශිල්ප සංවිධාන සද්භාවයෙන් පෙළගැන්වීම ද අපගේ මෙහෙවර වේ.

**Our Mission**

To share with the children of Sri Lanka the knowledge of the aesthetic visual image.
To help build up dignified professionals with human touch.
To pioneer a image arts trade where artists engage in a creative visual medium and present the Sri Lankan identity to the world highlighting her rich heritage and culture.
To bring together image artists, image art lovers and professional photographic associations of Sri Lanka.
To join hands effectively with the national and international image art and cultural organizations for a fruitful future.

මෙම දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ පසුගිය අර්ධ වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලදුව, එහි දී සම්මත කොට සංගමයේ ඉදිරි ව්‍යවස්ථාවට සහ අන් සියලු කාර්යයන් සඳහා අදාළ කොට ගැනීමට නියමිත ඒවා ය.

## සිනමා රූප Motion Pictures
## මහින්දගේ නව ශාස්ත්‍රීය සත්කාරය

අප සංගමයේ ගරු සභාගී සාමාජිකත්වය හොබවන එම්.ඩී. මහින්දපාල මහතා සිය නවතම ශාස්ත්‍රීය ග්‍රන්ථය "සිනමා රූප" නමින් එළිදක්වා ඇත. චලනය සටහන් කරගැනීමේ මානව ඉතිහාසයේ පළමු වෑයම, චිත්‍රය, ඡායාරූපය ඔස්සේ සිනමාව තෙක් වැඩි දියුණු වූ අයුරු මෙහි සාරගර්භ ලෙස විමසුමට බඳුන් කොට තිබේ. සිනමාවේ ශබ්ද තාක්ෂණය, වීඩියෝ තාක්ෂණවේදය, ආලෝකකරණ මූලධර්ම ඇතුළු සිනමා සාක්ෂරතාව උදෙසා අවශ්‍ය මූලික පැතිකඩයන් මෙම කෘතියෙහි අඩංගු ය. සිනමාලංකාරය ලෙස නම් කෙරුණු පරිච්ඡේදයක ලූමියර් සහෝදරයන්ගේ පටන් මුල් අවධියේ සිට සිනමාව මාධ්‍යයක් ලෙස වැඩි දියුණු කරලීමට දායක වූ පුරෝගාමීන්ගේ කාර්යභාරය ද මෙහි සවිස්තරාත්මක ව දක්වා ඇත. මෙය නුගේගොඩ සරසවි ප්‍රකාශයන්ගේ දොරට වැඩුමකි.

## ඉන්ද්‍රනාථ් තේනුවරගේ
## Panorama ඡායාරූප ප්‍රදර්ශනය

සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික, ප්‍රවීණ ඡායාරූප ශිල්පියකු, දේශකයකු සහ ලේඛකයකු වන ඉන්ද්‍රනාථ් තේනුවරගේ තෙවන ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය 'Panorama' නමින් 2010 ජූනි මස 11 සිට 14 දක්වා කොළඹ ජාතික කලා භවනේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම ප්‍රදර්ශනය සඳහා පැනොරාමා ආකාරයේ පුළුල් දර්ශන සහිත ඡායාරූප 25ක් පමණ යොදාගන්නා බව ඔහු පැවසූ අතර, මේ සඳහා ප්‍රධාන අනුග්‍රහය එප්සන් ඩීබග් ආයතනයෙන් ලබා දී ඇත.

## රූ රස කතිකාව ජූනි 06 දා

රූ රස කතිකාව සිනමා රසවින්දන වැඩසටහන් මාලාවේ එකොළොස්වැන්න ජූනි 06 වැනි ඉරු දින කළුබෝවිල සංගම් මූලස්ථානයේ දී පැවැත්වේ. ආචාර්ය ධර්මසේන පතිරාජයන්ගේ In Search of a Road වාර්තා චිත්‍රපටය මෙදින තිරගත කෙරෙන අතර නිර්මාණකරුවාගේ ප්‍රධානත්වයෙන් සංවාදාත්මක පිළිසඳර පැවැත්වේ. ඒ සඳහා ඔබ සැමදෙනාට දයාවෙන් ඇරයුම් කෙරේ.

රූ රස කතිකාව දොළොස්වන පියවර ලෙස Water චිත්‍රපටය ප්‍රදර්ශනය කොට ඒ පිළිබඳ සංවාදාත්මක සැසිවාරය පැවැත්වේ. ජූලි මස 11 වන දින මෙම වැඩසටහන සංවිධානය කෙරෙන අතර සංගමයේ ඩිප්ලෝමා වසර සාමාජිකත්වයට මේ සඳහා සහභාගිත්වය අනිවාර්ය වේ. සාමාජික ඔබ සැමට ද මේ සඳහා සහභාගි වන මෙන් ආරාධනා කෙරේ.

## සාමාජිකත්වය රැකගනිමු

දෙවසරකට වැඩි කලක් සාමාජික මුදල් නොගෙවූ සියලු දෙනාගේ සාමාජිකත්වය අහෝසි කිරීමට සිදුවේ. එබැවින් ඔබගේ හිඟ සාමාජික මුදල් වේ නම් එය පියවා සාමාජික වරප්‍රසාද රැක ගැනීමට කඩිනමින් ක්‍රියාත්මක වන මෙන් මෙයින් ඉල්ලා සිටිමු. 60 වන සංවත්සරය ඔබේ සාමාජික හිමිකම්වලට වඩාත් ඉහළ වටිනාකමක් ලැබෙන්නා වූ අවස්ථාවකි. එසේ ම සංවත්සර සැමරුම් උළෙල සඳහා ඔබගේ දායකත්වය එක් කිරීමේ පළමු නිල කාර්යය වන්නේ ද සාමාජිකත්වය රැක ගැනීම ය. එහෙයින් හිඟ සාමාජික මුදල් වේ නම් මුදලින්, චෙක්පතකින් හෝ ජූනි 20 මහා සභාවට පැමිණීමෙන් එය ගෙවිය හැකි ය. මේ පිළිබඳ විමසුමක් වෙතොත් මුදල් අධ්‍යක්ෂ සුනිල් ලියනගේ (077 2614360) මහතා අමතන්න.

## තන්තිරිමලේ ක්ෂේත්‍ර චාරිකාව

පාඨමාලා විද්‍යාර්ථීන්ගේ තුන් දින ක්ෂේත්‍ර චාරිකාව මෙවර මැයි 21, 22, 23 යන දිනවල තන්තිරිමලේ කේන්ද්‍ර කොටගෙන පැවැත්විණි. අධ්‍යාපන අධ්‍යක්ෂ සිතුමිණි රත්නමලල මහතාගේ සංවිධායකත්වයෙන් පැවැත්වූ මෙම ක්ෂේත්‍ර චාරිකාවට තන්තිරිමලේ ඇතුළු රජරට ප්‍රදේශයේ පාරිසරික හා ජන ජීවිතය අධ්‍යයනය සහ ඡායාරූප ගත කිරීම අරමුණු විය. ජ්‍යෙෂ්ඨ ඡායාරූප කලාවේදී හෙන්රි රාජකරුණා මහතා චාරිකා උපදේශනය සිදුකළ අතර චන්ද්‍රසේන පෙරේරා, කේ.පී. කීර්තිරත්න යන ජ්‍යෙෂ්ඨ සාමාජික භවතුන් ඊට අගනා සහයක් ලබා දුන්හ. සංගමයේ පාඨමාලා හදාරන විද්‍යාර්ථීන් 50 කට ආසන්න සංඛ්‍යාවක් මෙයට සහභාගි වූහ. චාරිකාවේ ඡායාරූප සම්බන්ධ පසු විවරණයක් හෙන්රි රාජකරුණා මහතාගේ ප්‍රධානත්වයෙන් ජූනි 06 වැනි දින ප.ව. 2.00 සිට කළුබෝවිල සංගම් මූලස්ථානයේ දී පැවැත්වේ

## ජාතික ඡායාරූප ප්‍රදර්ශන ප්‍රමිතියේ මුල් පියවර

### හලාවත තෙවන ඇස ඡායාරූප සංගමය

හලාවත තෙවන ඇස ඡායාරූප සහ මාධ්‍ය ශිල්පීන්ගේ සංගමය මගින් තෙවන වතාවට පවත්වනු ලැබූ ද්විවාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය ඉතා සාර්ථක ලෙස පැවැත්විණි. තරග අංශ පහක් යටතේ ජයග්‍රාහකයන්ට තිළිණ සහ සහතික පත්‍ර ප්‍රදානය ද ලක්දිව සම්මානනීය සිනමාවේදියෙකු වන ඇන්ඩෘ ජයමාන්නයන්ගේ මහඟු සේවාව අගයමින් සම්මාන ප්‍රදානයක් සිදු කිරීම ද විශාල ඡායාරූප කලා ලෝලීන් සංඛ්‍යාවකගේ ආශිර්වාද මධ්‍යයේ සිදු කෙරුණි. මෙම ප්‍රදර්ශනය අප සංගමය මගින් හඳුන්වා දෙනු ලැබූ ජාතික ප්‍රදර්ශන ප්‍රමිතියට යටත් ව මෙරට පැවැත්වූ ප්‍රථම ඡායාරූප ප්‍රදර්ශනය ලෙස දේශීය ඡායාරූප ඉතිහාසයට එක්වේ. ප්‍රදර්ශන සංවිධායකත්වය සිදුකළ අප සාමාජික සමන් ප්‍රනාන්දු මහතා ඇතුළු එම සංගමයේ සියලු කාරකාදීන්ට ඒ පිළිබඳ ශුභාශිංසන පිළිගැන්වේ.

## මාසික ඡායාරූප තරග ප්‍රතිඵල

### අප්‍රේල් 25 මාසික ඡායාරූප තරගය

**වර්ණ අංශය**

1වන ස්ථානය - චින්තක තේනුවර
2වන ස්ථානය - විරාජ් ලියනාරච්චි
3වන ස්ථානය - සඳුන් කාංචන
4වන ස්ථානය - එම්.ඒ.ඉඳුනිල් ජීවන්ත
5වන ස්ථානය - චින්තක තේනුවර

**කලුසුදු අංශය**

1වන ස්ථානය - චින්තක තේනුවර
2වන ස්ථානය - චින්තක තේනුවර
3වන ස්ථානය - පී.ඩී.දිල්ෂාන් නයනජිත්
4වන ස්ථානය - දිනේෂ් කුමාර
5වන ස්ථානය - හර්ෂ නිරෝෂණ කත්‍රිආරච්චි


1වන ස්ථානය - චින්තක තේනුවර

**තරග විනිශ්චය**

ප්‍රියන්ත අබේසුන්දර මහතා, යමුණි රශ්මිකා පෙරේරා මහත්මිය සහ සමන්ත සේනක බණ්ඩාර මහතා

### මැයි 16 විහාරමහාදේවී උද්‍යානය ඡායාරූප තරගය


1වන ස්ථානය - විරාජ් ලියනාරච්චි (ශූරතා පළිහ)

**කලුසුදු අංශය**

1වන ස්ථානය - විරාජ් ලියනාරච්චි (ශූරතා පළිහ)
2වන ස්ථානය - තරංග ඉන්‍ද්‍රජිත්
3වන ස්ථානය - හර්ෂ නිරෝෂණ කත්‍රිආරච්චි
4වන ස්ථානය - විරාජ් ලියනාරච්චි
5වන ස්ථානය - ප්‍රියන්ත බණ්ඩාර

**වර්ණ අංශය**

1වන ස්ථානය - චින්තක තේනුවර
2වන ස්ථානය - චින්තක තේනුවර
3වන ස්ථානය - කේ.එස්. අජිත් ප්‍රියතිලක
4වන ස්ථානය - සමීන්‍ද්‍ර ප්‍රනාන්දු
5වන ස්ථානය - විරාජ් ඩී. ගුණවර්ධන

**තරග විනිශ්චය**

එච්.එම්.ආර්. පෙරේරා මහතා.

## අපේ ශෝකය

- සංගමයේ හිටපු සභාපතිවරයෙකු මෙන් ම ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ද වන එම්.එම්.ආර්. පෙරේරා මහතාගේ දෙටු සොයුරු එම්.එම්.ඒ. පෙරේරා මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ සියලුදෙනාගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරමු.
- සාමාජිකා ධයනා ඩිමාලි පෙරේරා මහත්මියගේ දයාබර නැන්දනිය, ඇම්පිනෝනා අත්තනායක මාතාව පසුගිය දා අභාවප්‍රාප්ත වූවා ය. එම පවුලේ සැමදෙනා වෙත සංගමයේ ශෝකය පිරිනැමේ.
- හිටපු මුදල් අධ්‍යක්ෂ අභාවප්‍රාප්ත මෙරිල් සිල්වා මහතාගේ දයාබර මාමණ්ඩිය වූ ද, සාමාජික රේඛා නිලන්ති සිල්වා මහත්මියගේ දයාබර පියාණන් වූ ද ක්‍රිස්ටි පෙරේරා අබේසිංහ මහතා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳව සංගමයේ සාතිශය සංවේගය එම පවුලේ සැම වෙත පිළිගැන්වේ.
- සාමාජික (08/5258) ජේ.යූ. විමලසූරිය මහතාගේ මාමණ්ඩිය වූ ෂෙල්ටන් හෙන්රි ප්‍රනාන්දු මහතා අභාවප්‍රාප්ත විය.ඒ පිළිබඳ සංගමයේ සියලුදෙනාගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරමු.

## ආලෝකකරණ වැඩමුළුව කැනන් අනුග්‍රහයෙන්

සංගමයේ පාඨමාලා හදාරන විද්‍යාර්ථීන් සඳහා අධ්‍යාපන අංශය මෙහෙයවන ආලෝකකරණය පිළිබඳ විශේෂ ප්‍රායෝගික වැඩමුළුවක් ජූනි 13 වැනි ඉරුදින කළුබෝවිල සංගම් මූලස්ථානයේ දී පැවැත්වේ. එදින පෙරවරු 8.30 ට ආරම්භ කෙරෙන මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය සපයනු ලබන්නේ එච්. එම්. ආර්. පෙරේරා, පණ්ඩුක ද සිල්වා, ශාන්ත ගුණරත්න යන අපගේ ජ්‍යෙෂ්ඨ සාමාජික මහත්වරු ය. අනුග්‍රාහකත්වය කැනන් මෙට්‍රොපොලිටන් සමාගම විසිනි.

## www.npasslanka.org සංගමයේ වෙබ් අඩවිය

උක්ත ලිපිනයැති සංගමයේ වෙබ් අඩවියෙහි සාමාජික ඔබසැමගේ ද නම් ඇතුළත් කිරීමට තීරණය කොට ඇත. ඒ සමග පළකිරීම පිණිස ඡායාරූප ශිල්පයේ ඔබ විශේෂ නිපුණතාවක් දක්වන ක්ෂේත්‍රය/ක්ෂේත්‍ර කවරේ දැ යි සැම දිනක ම ප.ව. 8.00 ත් 9.00 ත් අතර දුරකථනයෙන් උපුල් රණේපුර (071 600 5 600) වෙත දැනුම් දෙන්න. පිටස්තරව විද්‍යුත් කැපැල් මගින් සිදුකෙරෙන සාමාජික ආමන්ත්‍රණ සහ විමසීම් සඳහා member@npasslanka.org ලිපිනය විවෘතව තැබෙනු ඇත.


පිළිසඳරට වෙහෙස මහන්සිය
ප්‍රකාශන අධ්‍යක්ෂ - ශාන්ත ගුණරත්න
ප්‍රකාශන අනු කමිටුව
ඉන්දික රත්නායක
විමල් ප්‍රියශාන්ත
නිශාන්ත ප්‍රියදර්ශන
දර්ශනී චතුරිකා